# වීනා මීනා
# සහ
# මායා මුට්ටිය



එල්.සිළුනි බිමංසා ද සිල්වා

# ටීනා මීනා සහ මායා මුට්ටිය

එල්.සිළුනි බිමංසා ද සිල්වා

2023-11-15

ISBN 978-624-206-777-3

# පිදුම

මහාමායා බාලිකා

විදුහලේ

ගරු විදුහල්පතිතුමියට,

ඇදුරු මඬුල්ලට

සහ

දයාබර දෙමාපියන්ට

සෙනෙහසින්

පිළිගන්වමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම් අපගේ වගකීමයි. එම ජාතික අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් ''දිවිය දිනන විද්‍යුත'' පොතක් ''ව්‍යෘපෘතිය හඳුන්වාදෙන ලද දරුවන්ට අත්දැකීම් සමුදායක'' මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතු වුන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර ''විද්‍යුත් පොතක'' ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහා දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනනමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.

ශෂිකලා සේනාධීර මිය
විදුහල්පතිනිය
මහාමායා බාලිකාවිද්‍යාය,
මහනුවර

එකෝමත් එක කාලෙක පුංචි ගම්මානෙක ටීනා, මීනා කියල දුප්පත් ළමයි දෙන්නෙක් හිටියා. මේ දෙන්නා හොඳම යාළුවෝ.



ඒ දෙන්නා ගමේ හැමෝටම උදවු කරලා ජීවත් වුණා. මේ දෙන්නා හොඳ ළමයි නිසා ගමේ හැමෝම මේ දෙන්නට ආදරෙයි.



ඔහොම ටික දවසක් ගෙවිල ගියා. එක දවසක් මේ දෙන්නා ගෙදර එනකොට සුරංගනාවියක් හම්බ වුණා.

ඒ සුරංගනාවි ළමයි දෙන්නගෙන් ''මොනවද ඔයාලට ඕනේ'' මම ඔයාලා කැමති ඕනම දෙයක් දෙන්නම් කිව්වා.



අපි හරිම දුප්පත් අපිට හැමදාම කන්න පුලුවන් දෙයක් දෙන්න ටීනායි මීනායි කිවුවා. සුරංගනාවිය මේ යාළුවෝ දෙන්නට ලස්සන මුට්ටියක් මැජික් යෂ්ටියෙන් මවලා දුන්නා.



මුට්ටිය මවලා සුරංගනාවිය අතුරුදහන් වුණා. එයාලාට හරිම සතුටුයි. එයාලා සුරංගනාවිය දුන්න මුට්ටියත් අරන් ගෙදර ගියා.

.



එයාලා සුරංගනාවිය දුන්න මුට්ටිය ඇරලා බැලුවා. මුට්ටිය ඇතුළේ කොළයක් තිබුණා. දෙන්නාම එකවර කොළය කියෙව්වා.



''මුට්ටිය අපට කෑම දෙන්න'' ටීනා කිරි පැණි ඉල්ලුවා. එකපාරටම මුට්ටිය කිරි පැණි වලින් පිරුණා.



''කමු කමු හරිම රසයි'' මීනා කිවුවා ''අයියෝ මෙන්න උතුරනවා'' ටීනා කිවුවා.



''හැමෝම එන්න'' යාළුවෝ දෙන්නා කෑගැසුවා.



ටීනා සහ මීනා යාළුවෝ සමඟ කිරි පැණි කෑවා.



ගමේ අයත් ඇවිත් සතුටින් කිරි පැණි කෑවා. ටිනා සහ මීනා හැමදාම සතුටින් ජීවත් වුණා.





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දියුනතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට ගොදුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20

ISBN 978-624-206-777-3